**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නර්තනය - 10 ශ්‍රේණිය / පළමුවන වාරය**

**සැකසුම - දැරණියගල අධ්‍යාපන කොට්ඨාසය / දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

නිපුණතාව : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය කරයි.

චාමර නැටුම නිර්මාණය කරමු.

- පහත දැක්වෙන්නේ චාමර නැටුමක රූප සටහනකි.



- ඔබ, පසුගිය පාඩමේ දී චාමර කවි පිළිබඳව මූලික දැනුමක් ලබාගන්නට ඇත.
- මෙම පාඩමේ දී අපි, චාමර කවිවලට සුදුසු පද යොදා ගනිමින් අලංකාර චාමර නැටුමක් නිර්මාණය කරමු.
- එහිදී ඔබ, අන්තර්ජාලය භාවිත කරමින් චාමර නර්තනයක් ඇතුළත් වීඩියෝ පටයක් නැරඹීමට යොමුවන්න.
- එම වීඩියෝ පටය නැරඹීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

1. නර්තන නිර්මාණය සඳහා යොදාගෙන ඇති චලනවල ස්වභාවය
2. එම චලනවලදී චාමරය හසුරුවන ආකාරය
3. නර්තනාංගය සඳහා යොදා ගෙන ඇති පද නිර්මාණය
4. නර්තනාංගය ඉදිරිපත් කිරීමේ දී අවකාශය භාවිත කර ඇති ආකාරය
5. රංග රටා නිර්මාණය
6. පසුබිම් වාදනය හා ගායනය
7. නර්තනයේ ප්‍රාසංගික බව ඉස්මතු කිරීමට යොදාගන ඇති රංග වස්ත්‍රාභරණ
8. නර්තනය නිර්මාණයේ සමස්ත නිමාව

**පැවරුම**

- ඉහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් චාමර නැටුමක් නිර්මාණය කරන්න.

පියවර 01 - පළමුව පින්තූරයේ ඇති ආකාරයට අඩියක් පමණ දිග රවුම් ලී දෙකකට රැලි යොදා චාමර දෙකක් සකස් කරගන්න.

පියවර 02 - ඔබ, පෙර පාඩමේ දී උගත් චාමර කවිවලින් කැමති කවියක් තෝරා ගන්න.

පියවර 03 - ඔබ නැරඹූ නර්තනාංගය සිහියට නගමින් තෝරාගත් කවියට සුදුසු අයුරින් පද නිර්මාණය කරන්න.

පියවර 04 - ගායනය සමඟ නර්තනයේ යෙදෙන්න.

පියවර 05 - සමස්ත නිමාවක් ඇති චාමර නර්තනයක් නිර්මාණය කරන්න.

පියවර 06 - නිර්මාණය කරන ලද නර්තනය හොඳින් පුහුණු වන්න.

පියවර 07 - පුහුණුවන ලද නර්තනාංගය පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

කේ. ඩී. එල්. ඩී. ඉන්ද්‍රශාරී
කෑ/දෙහි/දෙමැද ක. වි.